සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 07 - 2023

## නර්තනය I,II

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

★ සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

■ දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.
(කඩිප්පුව, සුළු තනිතිත, ඉස්ලාම්, සිව් අඩිය, 2 + 3)

1. හතරවන ගොඩ සරඹයේ සරඹ නාමය .............................. ලෙස හඳුන්වයි
2. දොං ජිංත ගත දොංත යන බෙරපදය මාත්‍රා .............................. තාලරූපයට අයත් වේ.
3. දවුල වාදනයට යොදාගන්නා උපකරණය .............................. ලෙස හැඳින්වේ.
4. රාමසාන් උත්සවය .............................. බැතිමතුන්ගේ උත්සවයකි.
5. හනුමා වන්නමේ තිත්රූපය .............................. වේ.

අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.

6 කමතේදී කුල්ල හඳුන්වන්නේ යතුර නමිනි. ( )

7 ගැටබෙරය ආදේශ භාණ්ඩයකි. ( )

8 ශරීරාංග හැඩගස්වා ගැනීමට ශාරීරික නම්‍යතා අභ්‍යාස කිරීම ඉතා වැදගත් වේ. ( )

9 මැදුම් තනි තිතට මාත්‍රා 4ක් අයත් වේ. ( )

10 ලෙල දෙමිනේ මල .......................... යන කවිය තලමල වරුණට අයත් කවියකි. ( )

■ 11 සිට 15 දක්වා ප්‍රශ්ණ වලට වඩාත් ගැලපෙන පද දෙක තෝරා A හා B කාණ්ඩ යා කරන්න.

| A | B |
|---|---|
| 11 රත්නවල්ලි කවි | පසුපෙර අඩිය |
| 12 වෙසක් කැකුළු ගීතය | ද්‍රවිඩ නර්තනය |
| 13 හත් අඩියේ පියුම | මර්සලින් ජයකොඩි පියතුමා |
| 14 කරගම් | කුලු නැටුම |
| 15 6 වන පාසරඹය | ගොප් සැරසිලි |

■ 16 සිට 20 දක්වා ප්‍රශ්ණ වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16 "සඳවට තරුවැල් ඇවිදින්" යනු

i තාලම් කවියකි ii කුලු කවියකි

iii ලී කෙළි කවියකි iv කළගෙඩි කවියකි

17 "තත් තොග තක තොග" යන්න

i තුරඟා වන්නමේ අඩව්ව යි ii වෛරොඩි වන්නමේ අඩව්වයි

iii හනුමා වන්නමේ අඩව්වයි iv හනුමා වන්නමේ කස්තිරමයි

18 සරඹ අභ්‍යාසයේ දී බෙරවාදනයෙන් තොරව පුහුණු වන්නේ

i ගොඩ සරඹයි ii පාසරඹ යි

iii මාත්‍රා පහයි iv වට්ටම යි

19 සිදුහතුන්ගේ අභිනිෂ්ක්‍රමණය ගැන කියවෙන වන්නමකි

i තුරඟා වන්නම ii සැවුලා වන්නම

iii හනුමා වන්නම iv සිංහරාජ වන්නම

20 කෘෂිකර්මාන්තය හා සම්බන්ධ ගැමි නැටුමක් වන්නේ

i ලී කෙළි නැටුම ii තාලම් නැටුම

iii කුලු නැටුම iv වෙස් නැටුම

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.**

01 ගැමි ජනයා විසින් නිර්මාණය කරගන්නා නැටුම් ගැමි නැටුම් ලෙස හැඳින්වේ.

i ගැමි නැටුම් 04ක් නම් කරන්න

ii ඉන් එක් ගැමි නැටුමකදී භාවිතා කළ කවියක් ලියන්න.

iii ගැමි නර්තනයකදී නිර්මාණය කරගත හැකි රංග රටා දෙකක් අඳින්න.

iv ගැමි නැටුමක් හඳුනාගත හැකි පොදු ලක්ෂණ 4ක් ලියන්න.

02 ඔබ නිර්මාණය කරන ලද විකල්ප උපකරණ ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.

i ඉවත දමන ලද ද්‍රව්‍ය වලින් සාදාගන්නා විකල්ප වාද්‍ය භාණ්ඩ 03ක නම් ලියන්න.

ii පෙරහැරක දැකිය හැකි සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 02ක් නම් කර ඊට ආදේශ කළ හැකි විකල්ප වාද්‍ය භාණ්ඩයක නම ලියන්න.

iii ඔබ විසින් නිර්මිත විකල්ප වාද්‍ය භාණ්ඩයේ රූපසටහනක් ඇඳ දක්වන්න.

03 පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටිසටහන් ලියන්න.

i පා සරඹ ii පෙරහැර iii රාමසාන් උත්සවය iv දෙතිත

04 සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස දවුල භාවිතා වේ.

i දවුල භාවිතා කරමින් කරනු ලබන වාදන අවස්ථා 03ක් නම් කරන්න.

ii දවුල් ඇස සඳහා භාවිතා කරන සම්වර්ග දෙකක් සහ කඳ නිර්මාණය කිරීමට යොදාගන්නා දැව වර්ග දෙකක් ලියා දක්වන්න.

iii දවුලෙහි රූප සටහනක් ඇඳ කොටස් හතරක් නම් කරන්න.

05 දේශීය කලාංග අතර ගොප් සැරසිලි කලාව වැදගත් තැනක් ගනී.

i ගොක් කොළ ඇසුරින් නිර්මාණය කරන සැරසිලි අංග තුනක් ලියන්න.

ii සැරසිලි අංගයක් නිර්මාණය කිරීමේදී සැලකිය යුතු කරුණු 03ක් සඳහන් කරන්න.

iii ගොක් සැරසිලි ඇසුරින් කරන ලද නිර්මාණයක රූප සටහනක් ඇඳ දක්වන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 07 - 2023**

# නර්තනය

නම / විභාග අංකය:

## ප්‍රායෝගික පරීක්ෂණය

1) i කැමති ගායනය — ලකුණු 05
ii නම්කළ ගායනය (කුලු, තාලම්, තුරඟා වන්නම) — ලකුණු 05

2) i ගොඩ සරඹ 3 හෝ 4 නර්තනය — ලකුණු 04
ii කස්තිරම නර්තනය — ලකුණු 06

3) i හනුමා වන්නම නර්තනය කිරීම (මාත්‍රා) — ලකුණු 04
ii කස්තිරම, සීරුමාරුව, අඩව්ව — ලකුණු 06

4) ගැමි නැටුමක් නර්තනය කරන්න — ලකුණු 05
කුලු හෝ තාලම් — ලකුණු 10

5) නර්තනය මාධ්‍යයෙන් ඉදිරිපත් කළ හැකි සත්ව චරිතයක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබාදෙන්න.
ලකුණු 10

මුළු ලකුණු 50